# <u>සිංහල භාෂාව හා සාහිත්‍යය</u>

# <u>දීපාවලි උත්සවය</u>

ශ්‍රේණිය -: 10

වාරය -: තුන්වන වාරය

නිපුණතා මට්ටම් -: 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් හඳුනා ගැනීම සඳහා කියවයි.

-: 7.2. ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

ක්‍රියාකාරකම්.

ක්‍රියාකාරකම - 01

- පාඩම ඇසුරෙන් පිළිතුරු සපයන්න.

1) දීපාවලි උත්සවයට පාදක වන පුරාවෘත්ත මොනවා ද?

.....................................................................................................................................

2) මෙම උත්සවය යෙදෙන මාස කවරේ ද?

.....................................................................................................................................

3) හින්දු භක්තිකයන් එම දිනය සලකන්නේ කෙසේ ද?

.....................................................................................................................................

4) "දීපාවලි" යන වචනයෙහි අරුත කුමක් ද?

.....................................................................................................................................

5) දීපාවලිය සැමරීම කවර කලක සිට පැවතෙන සිරිතක් ද ?

.....................................................................................................................................

6) රතිඤ්ඤා දැල්වීමෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද?

.....................................................................................................................................

7) දීපාවලි උත්සවය පැවැත්වෙන දින ගණන කොපමණ ද?

.....................................................................................................................................

8) දීපාවලි උත්සවය වෙනුවෙන් හින්දු ජනයාගේ ප්‍රධාන කාර්යය කුමක් ද?

.....................................................................................................................................

9) හින්දු කතුන් රංගෝලි සිත්තම් සඳහා උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය මොනවා ද ?

.....................................................................................................................................

10) රංගෝලි සිත්තම් සඳහා යොදා ගන්නා රූප කවරේ ද?

..........................................................................................................................................

11) ශ්‍රී කාන්තාව ගෙන්වා ගැනීමට නිවෙස් වල සිදු කෙරෙන චාරිත්‍ර විධි සඳහන් කරන්න.

..........................................................................................................................................

12) නෙළුම් මලින් ප්‍රකාශ වන සංකේතාර්ථ දක්වන්න.

..........................................................................................................................................

13) ශ්‍රී ලක්ෂ්මියගේ අත් හතරින් නිරූපණය වන ගුණාංග මොනවා ද ?

..........................................................................................................................................

14) ගෝවර්ධන පූජාව පැවැත්වීම සඳහා වන හේතුව කෙටියෙන් ලියන්න.

..........................................................................................................................................

15) දීපාවලි අවසන් දින පිරිමි දරුවන් සිය සහෝදරියන්ට තෑගි දෙන්නේ මොනවා ද?

..........................................................................................................................................

**ක්‍රියාකාරකම - 02**

පාඩම ඇසුරෙන් පිළිතුරු ලියන්න.
දින පහක් පුරා පැවැත්වෙන දීපාවලි උත්සවයෙහි සිදුවීම් වෙන් වෙන් වශයෙන් ලියන්න.

1. පළමු දිනය : ...............................................................................................
2. දෙවන දිනය : ...............................................................................................
3. තුන්වන දිනය : ...............................................................................................
4. හතරවන දිනය : ...............................................................................................
5. පස්වන දිනය : ...............................................................................................

**ක්‍රියාකාරකම - 03**

පහත සඳහන් යුගල පද යොදා වාක්‍ය තනන්න.

| | |
|---|---|
| 1. සැප සම්පත් | 6. මිල මුදල් |
| 2. රැකී රක්ෂා | 7. ළමයි බමයි |
| 3. සිරිත් විරිත් | 8. වං හුං |
| 4. තෑගි බෝග | 9. සමිති සමාගම් |
| 5. ගේ දොර | 10. ඉඳුම් හිටුම් |

**ක්‍රියාකාරකම - 04**

තද්ධිත නාම සකස් කරන්න.
'වත්', 'මත්' , 'ත්ව' ප්‍රත්‍ය සහිත වචන පාඩමෙන් උපුටා ලියන්න.

| 'වත්' ප්‍රත්‍යය | 'මත්' ප්‍රත්‍යය | 'ත්ව' ප්‍රත්‍යය |
|---|---|---|
| | | |

**ක්‍රියාකාරකම - 05**

පාඩමේ ඇතුළත් පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කරන්න.

1. අභ්‍යන්තර
2. අරුණෝදය
3. දෙවහන
4. දේවාශිර්වාදය
5. මෝහාන්ධකාරය
6. නරකාසුරයා
7. ස්වර්ණාභරණ
8. පූජනීය
9. දෙවිඳු
10. ඒකාලෝක
11. සාම්ප්‍රදායික
12. දීපාවලිය
13. දිව්‍යාංගනාවන්
14. සුළැඟිල්ල
15. පූජාසනය
16. සිත්තම්
17. පාරම්පරික
18. සත්‍යාපේක්ෂාව
19. ව්‍යාපාරිකයෝ
20. නෙළුම් මල

## 7.2 නිපුණතා මට්ටමට අදාළ ක්‍රියාකාරකම්.

**ක්‍රියාකාරකම - 06**
පහත සඳහන් සන්නිවේදන ක්‍රම පිළිබඳ ව කෙටියෙන් හඳුන්වන්න.

1. අත්පත්‍රිකා
2. දැන්වීම්
3. සටහන් (Memo)

**ක්‍රියාකාරකම - 07**

ඔබට නියමිත පාඩමේ ඇතුළත් අත් පත්‍රිකාවේ හා දැන්වීමෙහි ආකෘතිය සම්බන්ධ ව තොරතුරු දක්වා හිස්තැන් පුරවන්න.

| අත් පත්‍රිකාව | දැන්වීම. |
|---|---|
| I. මාතෘකාව<br>................................................................<br>................................................................ | I. භාණ්ඩය / සේවාව<br>................................................................<br>................................................................ |
| II. නිකුත් කරන්නාගේ තනතුර<br>................................................................<br>................................................................ | II. නිෂ්පාදන / සේවා ආයතනයේ නම<br>................................................................<br>................................................................ |
| III. ස්ථානයේ /ආයතනයේ නම<br>................................................................<br>................................................................ | III. භාණ්ඩය හෝ සේවාව ලබා ගැනීමෙන් අත්වන ගුණ වාසි හා ප්‍රතිලාභ<br>................................................................<br>................................................................ |
| IV. ලිපිනය / දුරකථන අංකය<br>................................................................<br>................................................................ | IV. ලිපිනය / දුරකථන අංකය<br>................................................................<br>................................................................ |

**ක්‍රියාකාරකම් - 08**

1. ඔබ පාසලේ පැවැත්වීමට නියමිත පොත් ප්‍රදර්ශනය පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

2. මැදිරිගිරිය, මහ අඹගස්වැව විවිධ භෝග වගා කටයුතුවල නියුක්ත වූවන් උදෙසා ගොවි සමාජයක් ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇත. එම සමාජයේ කැඳවුම්කරු වන සිරිපාල අමරතුංග ඔබ යැයි සිතා ගොවි පිරිස් එක්රැස් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. සංගමයේ අරමුණු, පැවැත්වෙන ස්ථානය, දිනය ,වැඩසටහන පිළිබඳ තොරතුරු දැන්වීම් පත්‍රිකාවේ ඇතුළත් විය යුතු ය.